# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1478/7 – 2007 ජනවාරි 01 වැනි සඳුදා – 2007.01.01

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

5 වන වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වගන්තිය සමග කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් ; එම වගන්තිය යටතේ පනවන ලද 2006 ඔක්තෝබර් 05 දිනැති සහ අංක 1465/20 දරන අති විශේෂ *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග 2007.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.)

2006 දෙසැම්බර් මස 29 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

1. එම උපලේඛනයේ 26 වැනි අයිතමයට ඉක්බිතිව පහත සඳහන් නව අයිතමයන් එකතු කිරීමෙන් :-

27. යම් ඒකක භාර නිකුත් කිරීම, මාරු කිරීම හෝ පැවරීම සම්බන්ධයෙන් වන යම් ඒකක භාර සහතිකයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් ;

28. 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද කිසියම් බැංකුවක් විසින් සෑදිය යුතු යැයි හෝ ලියා අත්සන් කරනු ලැබිය යුතු යැයි නියමිත හෝ බලය දී ඇති යම් සාධන පත්‍රයක හෝ එබඳු බැංකුවක් විසින් එම බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සාදන ලද හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන බලපත්‍රයක් සහ ණයක් සඳහා වන යම් ඇපයක් සම්බන්ධයෙන් එම බැංකුවට පක්ෂව වෙනත් යම් තැනැත්තෙකු විසින් සාදන ලද හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක්.

01-286